# 50
## සීගිරි පද්‍යයන්හි සඤ්ඤකයේ භාවිතය

*කමලවීර, පී. එන්. ටී.*[1]

සිංහල වර්ණමාලාවේ ඇති සඤ්ඤක අක්ෂර සිංහලයට පමණක් ආවේණික අක්ෂර වේ. ප්‍රාකෘත භාෂා වන පාලි, සංස්කෘත හෝ සිංහල භාෂාවට ඥාතීත්වයක් දක්වන වංග, කොයිත්, නේපාල්, ඔරිස්සා යනාදි භාෂාවන්හි ද සඤ්ඤක අක්ෂර දැක ගත නොහැකි ය. මෙම අක්ෂර මුලින් ම හමුවන සීගිරි පද්‍යයන්හි එය භාවිත වූයේ කෙසේ යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ පරමාර්ථයයි. ඒ සඳහා සීගිරි පද්‍ය, සීගිරි පද්‍ය අශ්‍රයෙන් රචිත පර්යේෂණ කෘති, ශිලා ලිපි සහ සිංහල ව්‍යාකරණ ග්‍රන්ථ මූලාශ්‍රය ලෙස භාවිත කර ඇත. සිංහල භාෂාවේ 'ග, ජ, ඩ, ද, බ' යන ඝෝෂ අල්පප්‍රාණ අක්ෂර සමඟ 'ඞ, ඤ, ණ, න, ම' යන වර්ගාන්තවල අර්ධය සංයෝග වී 'ඟ, ඦ, ඬ, ඳ, ඹ' යන සඤ්ඤක අක්ෂර නිර්මාණය වේ. මෙම සඤ්ඤක අක්ෂර ඍජු ලෙස ම ක්‍රි. ව. 8, 9, 10 සියවස්වලට අයත් සීගිරි පද්‍යයන්හි භාවිත වී ඇත. එහෙත් බොහෝ අවස්ථාවන්හි ඍජු ව ම මෙම සඤ්ඤකය නොයෙදී ඒ වෙනුවට එහි සංයෝග ව ඇති ඝෝෂ අල්පප්‍රාණ අක්ෂර සහ වර්ගාන්ත අක්ෂර වෙන වෙන ම ලියැවී ඇති ආකාරය ද හඳුනා ගත හැකි ය. මෙය වඩාත් පැහැදිලි ව පෙනෙන්නේ තත්භව පද විමසන කල්හි ය. මීට හේතුව මෙම කාලය වන විට සඤ්ඤකය සම්බන්ධයෙන් පුරාණ ආචාර්යවරුන් අතර විවිධ මතභේද පැවතීම මත සඤ්ඤකය භාවිත කිරීම හා නොකිරීම යන මත දෙකට අයත් ගුරුකුල දෙකක් තිබීම විය හැකි ය. මේ බව 'සිදත්සඟරාව' හා 'එළු සඳැස් ලකුණ' ආදි පැරණි ව්‍යාකරණ ග්‍රන්ථ අධ්‍යයනය කිරීම මඟින් ද පැහැදිලි වේ. ඒ අනුව සීගිරි ගී රචනා කළ ජනයා අතර ද මෙම ගුරුකුල දෙකට ම අයත් වූවන් සිටින්නට ඇති හෙයින් මෙලෙස සීගිරි පද්‍යයන්හි සඤ්ඤකය මෙන් ම සංයෝග නොවූ නාසික්‍ය ශබ්ද ද වෙන වෙන ම භාවිත වන්නට ඇත. එහෙත් පසු කාලීන ව සිදු වූ භාෂා ව්‍යවහාරයේ වර්ධනයත් සමඟ වර්තමානය වන විට සඤ්ඤකය ස්ථාවර අක්ෂරයක් ලෙස සිංහල වර්ණමාලාවට ද ඇතුළත් ව ඇත.

ප්‍රමුඛ පදඃ සිංහල වර්ණමාලාව, සඤ්ඤකය, අර්ධානුනාසික්‍ය, සීගිරි ගී, සිදත් සඟරාව

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය.*